2026 ක් වූ මාර්තු 16 වන දින

ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් - Building Contracts

නිවාස තැනීම් සඳහා ඇති කරගන්නා ගිවිසුම් Building Work Contractors Act 1995 (SA) පනතට අනුව $20,000 ට වැඩි වටිනාකමක් ඇති නම් එකී ගිවිසුම් ලිඛිත හා පහසුවෙන් කියවීමට හැකි ලෙස තිබිය යුතු බවත් ගොඩනැගිලි කොන්ත්‍රාත් කරු ගේ නම, බලපත් අංකය ඇතුළු සියලු විස්තර අඩංගු විය යුතු බවත් දැක්වේ. තවද එකී ගිවිසුමට අදාල කොන්දේසි පැහැදිලිව සඳහන් විය යුතු අතර සියළු පාර්ශවයන් විසින් එයට අත්සන් තැබිය යුතුය.

පෞද්ගලිකව නිවසක ගොඩනැගිල්ල දික් කිරීමක්, නැවත අලුත් වැඩියා කිරීමක්, සම්පූර්න ගොඩනැගිල්ලක් ඉදිකිරීමක් හෝ වේවා ගොඩනැගිලි ඉදිකරන්නන් සමග ලිඛිත ගිවිසුමක් තිබීමේ වැදගත්කම බොහෝමයක් තුල මනා වැටහීමක් නොමැත. සාමාන්‍යයෙන් වැඩ කරන දින 5 ක cooling off කාල සීමාවක් ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් වල ඇත. නිවාස ඉදිකිරීමට බලාපොරොත්තු වන අයගේ සිත වෙනස් වුවහොත් ගිවිසුමෙන් ඉවත් වීමට එකී කාලසීමාව තුල ලිඛිතව දැනුම් දී ඉවත් විය හැකිය.

එසේ අත්සන් කිරීමට පෙර නීතීඥවරයකු ලවා කොන්දේසි පැහැදිලි කරවා ගැනීම ඉතා වැදගත්වේ. සාමාන්‍යයෙන් ගොඩනැගිලි ඉදිකරන්නන් සඳහා වූ රක්ශණ ආවරනයක් ගොඩනැගිලි කොන්ත්‍රාත් කරු විසින් ලබාගෙන තිබිය යුතු අතර එය ලබා ගන්නා තුරු ගොඩනැගිලි ඉදිකිරීම පටන් ගැනීමට ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුට නීතියෙන් නොහැකිය.

මෙම අවස්ථාවේදී ඔබට ඇති විය හැකි ප්‍රශ්ණ කල් තියා හඳුනාගෙන නිරාකරණය කර ගැනීමට පුළුවන. ගිවිසුමේ යම් කොන්දේසි නොගැලපෙන්නේ නම් ඒවා නීතීඥවරයා ලවා දැනුම් දී ඉවත් කිරීම හෝ අනිත් පාර්ශවය සමග සාකච්ඡා කොට සමතයකට පත් කර ගැනීමටද ඔබට පුළුවන්.

අවාසනාවකට මෙන් සෑමදේම බලාපොරොත්තු ආකාරයටම සිදුනොවීම නිසා පාර්ශවයන් අතර ගැටලුකාරී තත්වයක් හටගැනීමට ඉඩ තිබේ. ආරවුල් කල්තියා හඳුනා ගැනීම එතරම් පහසු කටයුත්තක් නොනුවත් එකී අවස්ථාවන් හීදී නීති සහය වේලාසනින් ලබාගැනීම වැදගත්වේ.

ගිවිසුම් පැහැදිලි කරගැනීම සඳහා හෝ ආරවුල් සමතයකට පත් කර ගැනීම උදෙසා නීති සහයට Troubridge Barristers & Solicitors හි අපගේ සොලිසිටර්වරුන් අමතන්න.